## හයවන මොඩියුලය

| වගකීම් සහ බැඳීම් | | |
|---|---|---|
| | දේශන පැය ගණන | 6 |
| | ඇගයුම් ක්‍රමවේදය | පන්ති කාමර සාකච්ඡා |
| | අධ්‍යයන අරමුණු | මෙම මොඩියුලය අවසානයේ සහභාගීවන්නන් හට;<br>• ළමුන් වෙළඳාමට එරෙහිව සටන් වැදීම හා සම්බන්ධ වී පවතින වගකීම් හෝ බැඳීම් හඳුනා ගැනීමට; හා<br>• ළමුන් වෙළඳාමට එරෙහිව සටන් වැදීමට වගකීම හා බැඳීම පවතින්නේ කාහටද යන්න ඉගෙන ගැනීමට<br>හැකියාව ලැබෙනු ඇත. |

**a. සහභාගීත්වය, වළක්වා ගැනීම, ආරක්ෂණය, ප්‍රවර්ධනය හා පුනරුත්ථාපනය/ නැවත එක්කිරීම**

මෙම අත්පොතෙහි පූර්ව මොඩියුල පහ මගින් ඔබහට ළමුන් වෙළඳාම සිදුවන්නේ කවර ආකාරයකට ද; එහි විවිධ ආකාරයන්, හේතු සාධක හා ප්‍රතිවිපාක සහ ළමුන් වෙළඳාමට එරෙහිව සටන් කිරීම සඳහා පවතින ජාත්‍යන්තර හා දේශීය නෛතික රාමුව පිළිබඳ පුළුල් දැනුමක් හා අවබෝධයක් ලබා දී ඇත.

බිම් මට්ටමේ හෝ ඉදිරි පෙළ සිටින නීතිය බලාත්මක කරන්නා වූ නිලධාරීන් ලෙස, ළමා වෙළඳාම සහ එය ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න පිළිබඳව පමණක් දැනුවත්ව සිටීම ප්‍රමාණවත් නොවන්නේ ය. ළමා වෙළඳාමට එරෙහිව සටන් වැදීමට මෙම වගකීම් හා බැඳීම් දරා සිටින්නේ කවුද යන්න සහ කිනම් අදියන් හිදී මෙම වගකීම් හා බැඳීම් සංතෘප්ත විය යුතු ද යන්න පිළිබඳව ඉගෙන ගෙන තිබීම අත්‍යාවශ්‍ය වන්නේ ය. එමනිසා, මෙම මොඩියුලය විවිධ වගකීම් සම්බන්ධව විවිධාකාර මට්ටිවල දී හා විවිධ අදියරයන් හිදී පැන නඟින ළමුන් වෙළඳාමට එරෙහිව පවතින්නා වූ වගකීම් හා බැඳීම් පිළිබඳ සාකච්ඡා කරනු ඇත.

### 6.1 හැඳින්වීම

මෙම අත්පොතෙහි හතර වන සහ පස්වන මොඩියුල මගින් ළමුන් වෙළඳාමට එරෙහිව සටන් කිරීම සහ ඒ මත පැන නඟින වගකීම්හි ස්වභාවය පිළිබඳව අවධාරණය කරනු ලබන අන්තර්ජාතික නීති හා දේශීය නීතීන් හා ප්‍රතිපත්ති පිළිබඳව ඔබව දැනුවත් කර ඇත.

**පැලෙර්මෝ ප්‍රොටෝකෝලයට (*Palermo Protocol*) අනුව රාජ්‍ය බැඳී පවතිනවා:**

- මිනිස් වෙළඳාම සාපරාධී වරදක් කිරීම
- මිනිස් වෙළඳාමෙහි යෙදෙන්නන් විමර්ශණය කිරීම, නඩු පැවරීම, කිරීමට සහ දඬුවම් කිරීම
- දේශසීමා පාලනය පිළිබඳ ක්‍රියාමාර්ග ගැනීම
- එම පියවර තුළ සහ සිවිල් සමාජයේ සහයෝගය සහිතව
- වින්දිතයන් ආරක්ෂා කිරීමට සහ ඔවුනට සහයෝගය ලබා දීමට අවශ්‍යය පියවර ගැනීම
- නීතිය බලාත්මක කරන නිලධාරීන් සහ දේශසීමා නිලධාරීන් පුහුණු කිරීම
- වින්දිතයන් බවට පත්වීමට අවදානම ඇති තැනැත්තන් සහ මහජනයා දැනුවත් කිරීමට උත්සාහයන් දැරීම


ඒ අනුව, ඵලදායීව ළමුන් වෙළඳාම මුලිනුපුටා දැමීම සඳහා පහත සඳහන් අදියරයන්හි මැදිහත් වීමේ වගකීම වෙන් වෙන්ව සහ සමගාමීව සිදුකළ යුතු ය.

- ළමුන් වෙළඳාම වැළැක්වීම සඳහා
- ළමා වින්දිතයන් සහ අවදානමට ලක්ව සිටින ළමුන් ආරක්ෂා කිරීමට
- ළමා වෙළඳාමේ වින්දිතයන් බවට පත් වූ ළමුන් මුදා ගැනීමෙන් පසු පුනරුත්ථාපනය කිරීමට හා සමාජය හා ඔවුන් නැවත එකතු කිරීමට
- වළක්වා ගැනීම, ආරක්ෂණය, පුනරුත්ථාපනය හා නැවත එක් කිරීම යන ක්‍රියාදාමයන් තුළ සහභාගීත්ව හා අයිතීන් පදනම් කරගත් ප්‍රවේශයක් යොදා ගැනීම
- ළමුන් වෙළඳාමට එරෙහි වළක්වා ගැනීම, ආරක්ෂණය, සහභාගීත්වය, පුනරුත්ථාපනය සහ නැවත එක් කිරීමේ යාන්ත්‍රණයන් ප්‍රවර්ධනය කිරීම

ළමුන් වෙළඳාමෙහි වූ සියළුම අදියරයන් හිදී ඉහත දක්වා ඇති වගකීම් සපුරාලිය යුතු බව අවධාරණය කරනු ලැබ ඇත. ඒවා නම්;

- බඳවා ගැනීමේ අදියර
- සංචලනය වීමේ අදියර
- සූරාකෑමේ අදියර

ළමුන් වෙළඳාම මිනිස් වෙළඳාම මෙන් පහසුවෙන් අනාවරණය කරගත හැකි වරදක් නොවන්නේ ය. අනෙක් වරදවල් බොහොමයක් මෙන් නොව මිනිස් වෙළඳාම විවිධ වූ අදියරයන්වල දී පුද්ගලයන් කිහිපදෙනෙකු මැදිහත්ව විවිධ ස්ථානවල දී හෝ විවිධ රටවල දී සිදුවන විස්තීර්ණ වරදක් වේ. එබැවින්, ළමුන් වෙළඳාමට එරෙහිව සටන් වැදීම සහ එය වළක්වා ගැනීම සඳහා වූ වගකීම එක් තනි පුද්ගලයකු හෝ එක් නියෝජිත ආයතනයක උරහිස මත පතිත වන්නක් නොවන්නේය. එය බොහෝ පාර්ශවකරුවන්ගේ හා තනි පුද්ගලයන්ගේ සාමූහික වගකීමක් වන්නේ ය. එනම්;




මෙලෙසින්, ළමුන් වෙළඳාමට එරෙහිව සටන් වැදීමට නම් කවුරුන්, කුමන වගකීම්, කිනම් මට්ටමේ දී සපුරාලිය යුතු ද යන්න පිළිබඳ මනා අවබෝධයක් ලබා ගෙන සිටීම අවශ්‍යයෙන් කළ යුතු දෙයක් වන්නේ ය. මෙම මොඩියුලයේ ඊළඟ කොටස් ඉහත දක්වා ඇති කරුණු සාකච්ඡා කරනු ඇත.

## 6.2 ළමා වෙළඳාම වැළැක්වීම සඳහා වූ වගකීම

ළමුන් වෙළඳාම් කිරීමට එරෙහිව සටන් කිරීමේ දී ප්‍රධාන අත්‍යාවශ්‍යතාවක් වන්නේ ළමුන් වෙළඳාම් කිරීම නතර කිරීම සඳහා වූ මැදිහත් වීම් හා යාන්ත්‍රණයන් හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම ය. යම් තත්වයකට ප්‍රතිචාර දැක්වීමට වඩා ක්‍රියාකාරී උත්සාහයන් වඩා ප්‍රයෝජනවත් වන්නේය යන අදහස මත එය පදනම් වේ. නිවාරතා ප්‍රයත්නයන් මඟින් ළමුන් වෙළඳාම සම්බන්ධව, එය සිදුවීමෙන් පසු තත්ත්වය සකස් කරනවාට වඩා එය සිදුවීමට පෙර තත්ත්වය පිළිබඳ පාලනය කිරීම.

<table>
<tr><th>වගකීම් නිර්මාණය කරන්නා</th><th>වගකීම</th></tr>
<tr><td>රාජ්‍ය</td><td>
1. ළමුන් වෙළඳාම සාපරාධී වරදක් බවට පත් කිරීම<br><br>
• ස්වාභාවික පුද්ගලයකු/ පුද්ගලයන් හෝ නීතිමය පුද්ගලයෙක්/ පුද්ගලයන් විසින් කරනු ලැබුවා වුවද, පහත දැක්වෙන ව්‍යුහාත්මක ක්‍රියා සාපරාධී වරදවල් ලෙස ස්ථාපිත කිරීම සඳහා වන ව්‍යවස්ථාදායක සහ අනෙකුත් ක්‍රියාමාර්ග ගන්න.<br>
✓ ළමුන් වෙළඳාම් කිරීමට උත්සාහ කිරීම.<br>
✓ ළමුන් වෙළඳාම් කිරීමට සහාය වීම හෝ දිරිමත් කිරීම.<br>
✓ ළමුන් වෙළඳාම සඳහා වෙනත් පුද්ගලයින් සංවිධානය කිරීම සහ/ හෝ යොමු කිරීම.<br>
(මිනිස් වෙළඳාම දැනටමත් දේශීය නීති පද්ධතිය යටතේ වරදක් වන්නේ නම්, ළමුන් වෙළඳාම සඳහා වන වගකීම සහ දඬුවම් තීව්‍ර කිරීම සඳහා අදාළ නීතිමය විධිවිධාන සංශෝධනය කිරීම.)<br><br>
• අදාළ වැරදි සඳහා අපරාධ වගකීම ස්ථාපිත කර ඇති බව සහතික කිරීම සඳහා ව්‍යවස්ථාදායක සහ වෙනත් ක්‍රියාමාර්ග ගැනීම<br>
• ළමුන් වෙළඳාම සහ ඒ ආශ්‍රිත වැරදිවලට යොදාගත් උපකරණ හා මුදල් රාජසන්තක කිරීම සහ රාජසන්තක කිරීමෙන් ලැබෙන මුදල් වෙළඳාමට ගොදුරු වූ ළමුන්ගේ ප්‍රතිලාභ සඳහා යොදා ගැනීම පිණිස අවශ්‍ය නීතිමය සහ වෙනත් පියවර ගැනීම.<br>
• ළමුන් වෙළඳාම හෝ ඒ ආශ්‍රිත වැරදි සඳහා සක්‍රීයව හෝ නිශ්ක්‍රීයව සහාය වන දූෂිත රාජ්‍ය නිලධාරීන්, දූෂිතයන් බවට පත් කිරීම සඳහා වන නීතිමය හා පරිපාලනමය පියවර ගැනීම<br><br>
1995 දණ්ඩ නීති සංග්‍රහ සංශෝධනය - 1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහ (සංශෝධන) පනත සහ 2006 අංක 16 දරණ පනත<br>
1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශ පනත<br>
2006 අංක 31 දරණ ආගමනික හා විගමනික (සංශෝධන) පනත<br>
2005 අංක 30 දරණ වෛශ්‍යා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමයින් ජාවාරම්<br><br>
2. රාජ්‍ය නිලධාරීන් සතු ශක්‍යතාව වැඩි දියුණු කිරීම<br><br>
▪ ළමුන් වෙළඳාමට එරෙහිව සටන් කිරීම, දූෂණ පිටුදැකීම සහ ක්‍රියාකාරී විමර්ශනය යන ක්ෂේත්‍රයන්හි කටයුතු කරන සහ යුක්තිය පසිඳලීම, ආගමන සහ විගමන කටයුතුවල නියැලී සිටින හෝ ළමුන් සඳහා සපයනු ලබන ඕනෑම ආකාරයක සේවාවක නිරත වන රාජ්‍ය නිලධාරීන්ගේ<br>
(උදා: ළමා ආරක්ෂණ නිලධාරීන්, පාසල් ගුරුවරුන් යනාදී වශයෙන්) ශක්‍යතාවය ගොඩනැගීම හා දැනුවත්භාවය ඉහළ නැංවීම.<br><br>
3. රාජ්‍ය නිලධාරීන්, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ මහජනතාව අතර සහයෝගිතාව වැඩි දියුණු කිරීම. එනම්;<br><br>
▪ සමාජය සහ රාජ්‍ය නිලධාරීන් අතර සම්බන්ධතාවයේ දී තොරතුරු ලබා ගැනීමේ මධ්‍යස්ථාන සහ සන්නිවේදන මාර්ග පිහිටුවීම.<br>
▪ ළමා වෙළඳාම වැළැක්වීමේ යාන්ත්‍රණ හඳුන්වාදීමට පෙර සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් විසින් සිදු කරන ළමා වෙළඳාමේ යාන්ත්‍රණ සහ ළමා වෙළඳාමේ ස්වභාවය සහ පරිමාණය හඳුනා ගැනීම සඳහා ළමුන් වෙළඳාම පිළිබඳ දත්ත එකතු කිරීම සහ පර්යේෂණ කටයුතු වැඩි දියුණු කිරීම.<br>
▪ ප්‍රජා ප්‍රතිපත්ති වැඩසටහන් සංවර්ධනය කිරීම<br><br>
4. දරිද්‍රතාවය, අධ්‍යාපන අවස්ථා නොමැතිකම, මත්ද්‍රව්‍ය භාවිතය වැනි ළමයින් වෙළඳාම පිළිබඳ අවදානමට ගොදුරු විය හැකි විවිධ මට්ටම්වල පවතින අදාළ සාධකවල සම්පූර්ණ පරාසය
</td></tr>
</table>

| | |
|---|---|
| | ආමන්ත්‍රණය කිරීම සඳහා ක්‍රමවේදයන් සහ ක්‍රියාමාර්ග හඳුන්වා දීම.<br><br>5. වෙනත් රටවල දේශසීමා පාලන ආයතන සමඟ පවතින සහයෝගිතාවය ශක්තිමත් කිරීම සහ විශේෂයෙන් මෙහි ආරම්භක සහ අවසාන ඉලක්කය පිහිටි රටවල් අදාලව රටවල් අතර තොරතුරු හුවමාරු යාන්ත්‍රණයන් වැඩිදියුණු කිරීම. |
| **රාජ්‍ය ආයතන** | 1. ළමුන් වෙළඳාමට අදාළ නෛතික හා පරිපාලන යාන්ත්‍රණ ඵලදායී හා වගකිවයුතු ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම.<br><br>2. ළමුන් වෙළඳාම සඳහා භාවිතා කරන ව්‍යාජ ලියකියවිලි හඳුනා ගැනීම සහ සම්මුඛ පරීක්ෂණ ක්‍රම වැනි තාක්ෂණික නොවන හඳුනාගැනීමේ ක්‍රමෝපායන් වැඩිදියුණු කිරීම සඳහා අදාළ නිලධාරීන්ගේ හැකියාවන් ගොඩනැගීමට පහසුකම් සැපයීම.<br><br>3. දූෂිත නිලධාරීන් හෝ ළමුන් වෙළඳාමට සම්බන්ධ නීතිමය හා පරිපාලනමය විධිවිධාන උල්ලංඝනය කරන නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම.<br><br>4. සියලුම දේශීය හා විදේශීය රැකියා නියෝජිත ආයතන සහ මානව සම්පත් සේවා සපයන ආයතන (man-power agencies) ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම. |
| **මාධ්‍ය** | 1. ළමා වෙළඳාම පිළිබඳ ලක්ෂ්‍යයන්, පරිමාණය, ළමුන් වෙළඳාමේ ප්‍රතිවිපාක සහ ළමුන් වෙළඳාම සඳහා වන ද දඬුවම් පිළිබඳව දැනුවත් කිරීම සඳහා විද්‍යුත් මාධ්‍යවල හෝ මුද්‍රිත මාධ්‍යවල ප්‍රමාණවත් ඉඩ ප්‍රමාණයක් වෙන් කිරීම.<br><br>2. ළමුන් වෙළඳාමට නිශ්ක්‍රීය වශයෙන් හෝ සක්‍රීයව සම්බන්ධ වී සිටින හෝ උපකාර කරන පුද්ගලයින් සහ ආයතන හඳුනා ගැනීමට ලැබී ඇති තොරතුරු බලධාරීන් සමඟ හෝ උපකාරී හුවමාරු කර ගැනීම මඟින් අදාළ බලධාරීන්ට සහාය වීම.<br><br>**සදාචාරාත්මක වාර්තාකරණය සඳහා වූ මාර්ගෝපදේශයන්:**<br>• කිසිදු හානියක් නොකරන්න - කෙටිකාලීන වශයෙන් හා/ හෝ දිගු කාලීනව වින්දිතයකු බවට පත් වූ දරුවාගේ තත්ත්වය වඩාත් නරක අතට හැරෙන කිසිදු ආකාරයේ සම්මුඛ පරීක්ෂණයක් හෝ තොරතුරු හෙළි කිරීමක් සිදු නොකරන්න.<br><br>• වාර්තා කිරීමේ ක්‍රියාවලියට පෙර හා ක්‍රියාවලිය පුරාම ළමා වින්දිතයාගේ සහ/ හෝ දෙමාපියන්ගේ, භාරකරුවන්ගේ කැමැත්ත ලබා ගන්න. ඔවුහු ඕනෑම අදියරක දී හෝ කිසියම් අංශයක් සම්බන්ධයෙන් කැමැත්ත ඉල්ලා අස්කර ගන්නේ නම් ඔවුන්ගේ එම තීරණයට ගරු කරන්න.<br>• ළමා වින්දිතයින්ගේ සහ සාක්ෂිකරුවන්ගේ පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව සඳහා ප්‍රමුඛතාවය දෙන්න සහ ගරු කරන්න - වාර්තාකරණ ක්‍රියාවලිය පුරාම විශේෂයෙන් භාවිතා කරන ලද ඡායාරූප සම්බන්ධයෙන් මූලාශ්‍රයේ අනන්‍යතාවය සහ රහස්‍යභාවය ආරක්ෂා කරන්න.<br><br>• ළමා වින්දිතයින් නැවත කම්පනයට පත් නොකරන්න - ළමා වින්දිතයාට චිත්තවේගීය ලෙස පීඩාවක් ඇති කරන ආකාරයට ප්‍රශ්න නොකරන්න. ප්‍රශ්නවලට පිළිතුරු දීමට ඔවුන්ට බල නොකරන්න. නිවැරදි තොරතුරු පමණක් සපයන්න - ළමා වින්දිතයින්ට හෝ ඔවුන්ගේ දෙමාපියන්ට/ භාරකරුවන්ට සෑම විටම නිවැරදි තොරතුරු සැපයීමට නොහැකි වනු ඇත. ඔවුන් විවිධ වේලාවන්හි වෙනස් ආකාරයකින් සිදුවීම් මතක තබා ගන්නවා විය හැකි ය.<br><br>• ජනමාධ්‍යවල භාවිතා කරන්නා වූ භාෂාව ගැන සැලකිලිමත් වන්න - ළමා වින්දිතයාව අපකීර්තියට, වේදනාවට පත් කිරීමට හෝ පහත් කොට සැලකීමට හේතු වන වචන හෝ වාක්‍ය ඛණ්ඩ භාවිතා නොකරන්න. |

| | |
|---|---|
| | |
| **අන්තර්ජාතික සංවිධාන/ සිවිල් සංවිධාන/ ප්‍රජාව හා තනි පුද්ගලයන්** | **අන්තර්ජාතික සංවිධාන**<br>ළමා වෙළඳාම සම්බන්ධයෙන් ආමන්ත්‍රණය කිරීම උදෙසා ආණ්ඩුවේ සහ එහි ආයතනවල ශක්‍යතාවන් ඉහළ නැංවීම<br>**සිවිල් සමාජ සංවිධාන/ ප්‍රජාව හා තනි පුද්ගලයන්**<br>✓ ඔවුන්ගේ ප්‍රජාව තුළ වන ළමුන් වෙළඳාමට අදාළ ඕනෑම ආකාරයක තොරතුරු සැපයීම හරහා අදාළ අධිකාරීන් වෙත සහායෝගය දැක්වීම.<br>✓ ළමුන් වෙළඳාම ධෛර්යමත් කරන ආකාරයේ වූ සැපයීම් හෝ ඉල්ලුම නොතකා හැරීම මගින් ළමුන් වෙළඳාම දෝෂදර්ශනයට ලක් කරන්න.<br>උදාහරණ ලෙස: *ළමුන් වෙළඳාම ධෛර්යමත් කරන ආකාරයේ ඉල්ලුම: ලාභදායී ගෘහස්ථ කම්කරු සේවය, ගණිකා වෘත්තිය, ළමා මනමාලියන්, නීති විරෝධී කර්මාන්ත තුළ වූ කම්කරු සේවය*<br>උදාහරණ ලෙස: *ළමුන් වෙළඳාම ධෛර්යමත් කරන ආකාරයේ සැපයීම: මිනිස් වෙළඳාමේ යෙදෙන්නවුන්ට වාහන කුළියට සැපයීම, මිනිස් වෙළඳාම සඳහා ව්‍යාජ ලියකියවිලි සෑදීමට ස්ථානයන් බදු දීම හෝ ළමුන් වෙළඳාමට ගොදුරු වූ දරුවන් රඳවා තබා ගැනීම.* |

## 6.3 වෙළඳාමට හසු වූ ළමා වින්දිතයන් ආරක්ෂාකර ගැනීම සඳහා වන වගකීම

ළමුන් වෙළඳාම නතර කිරීම සඳහා වූ නිවාරතා උත්සාහයන් හඳුන්වා දී තිබෙන අතරතුර, වින්දිතයන් ආරක්ෂා කිරීම හෝ ළමා වෙළඳාවේ වින්දිතයකු වීමට හැකියාව ඇති තැනැත්තන් ආරක්ෂා කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගැනීම ද ඒ හා සමානව වැදගත් වන්නේ ය. ඵලදායී වින්දිතයන් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණයක් මගින් පහත සඳහන් අංශයන් සඳහා ආමන්ත්‍රණය කළ යුතු ය.

- වින්දිතයන් හඳුනා ගැනීම

  හදිසි හා දිගු කාලීන සේවා, නිවාස, ආහාර, වෛද්‍ය හා දන්ත රැකවරණය, නීතිමය සහාය, සහ අධ්‍යාපනයට, වෘත්තීය පුහුණුවට, සහ ආර්ථික අවස්ථාවන්ට ප්‍රවේශ වීම ඇතුළුව අවශ්‍යය සේවාවන් මොනවාද යන්න තීරණය කිරීම සඳහා වින්දිතයන් හඳුනා ගැනීම ඉතා වැදගත් වේ.
- අදාළ සේවාවන් සඳහා වූ නිර්දේශයන් සැපයීම

  පහත දක්වා ඇති වගුව මගින් ළමා වෙළඳාමට ගොදුරු වූ වින්දිතයන් ආරක්ෂා කිරීමේ වගකීම් පෙන්වා දෙනු ඇත.

| බැඳී සිටින්නා | වගකීම |
|---|---|
| රජය | 1. ඵලදායී වින්දිතයින් හඳුනා ගැනීමේ යාන්ත්‍රණයක් සහ ශක්තිමත් යොමු කිරීමේ සේවාවක් ඇතුළත් පුළුල් ළමා වින්දිතයින් ආරක්ෂා කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම.<br>▪ ළමා වෙළඳාමට ගොදුරු වූවන් හඳුනා ගැනීමට සහ ඔවුන්ව සම්මුඛ සාකච්ඡා කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ සේවා සපයන්නන් සඳහා නිරන්තර පුහුණුවක් ලබා දීම<br>▪ ළමා වින්දිතයින් ආරක්ෂා කිරීමේ පද්ධතියේ නිසි ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය මානව, මූල්‍ය හා වෙනත් සම්පත් වෙන් කිරීම<br>▪ විමර්ශනය, නීතිය බලාත්මක කිරීම සහ නඩු පැවරීම ඇතුළුව අපක්ෂපාතී යුක්තිය |

<table>
<tr><td></td><td>පසිඳලීමේ ක්‍රියාවලිය වෙත සමානාත්මක හා ඵලදායී ප්‍රවේශයක් ලබා දීම සහතික කිරීම<br><br>✓ අපරාධවලට ගොදුරු වූවන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියක් 2015 අංක 04 දරණ අපරාධ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීම සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ පිහිටු වීම.<br>✓ ශ්‍රී ලංකා පොලිසියේ ළමා හා කාන්තා කාර්යාංශය.</td></tr>
<tr><td>රාජ්‍ය ආයතන</td><td>1. ළමා වෙළඳාමට ගොදුරු වූවන් සහ අවදානමට ලක්ව සිටින ළමුන් පිළිබඳ කල්තියා හඳුනා ගැනීමේ යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම<br>2. විමර්ශන සහ නඩු පැවරීම් ඵලදායී ලෙස සිදු කිරීමට විමර්ශකයින් සහ නඩු පවරන්නන් දිරිමත් කිරීම<br>3. ළමා වින්දිතයින් දෙවන වරටත් වින්දිතයන් බවට පත්වීම වැළැක්වීම සඳහා විකල්ප විමර්ශන උපාය මාර්ග යොදා ගැනීම<br>4. ඵලදායී වින්දිත සහාය ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම. උදාහරණයක් වශයෙන්; වින්දිතයන් හට<br>▪ ස්ථිර හෝ තාවකාලික පදිංචිය ලබා දීම<br>▪ ළමා වින්දිතයින් සඳහා නවාතැන්, සෞඛ්‍ය මධ්‍යස්ථාන, අධ්‍යාපන හා වින්දනාත්මක පහසුකම් ක්‍රියාත්මක කිරීම<br>5. නීතිය ක්‍රියාත්මක කරන්නන්, සේවා සපයන්නන් සහ සිවිල් සමාජය අතර සහයෝගීතාව වැඩි දියුණු කිරීම තුළින් විචිත්‍රවත් හා ළමා හිතකාමී උපදෙස් සඳහා යොමු කිරීමේ පද්ධතියක් (referral system) ක්‍රියාත්මක කිරීම. උදා: ඵලදායී හදිසි ඇමතුම් (hotline) සේවාවක් ස්ථාපිත කිරීම සහ කළමනාකරණය කිරීම<br>6. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ සහ සේවා සපයන්නන්ගේ සන්නිවේදන කුසලතා වැඩි දියුණු කිරීම<br>7. සෑම විටම දරුවාගේ අයිතිවාසිකම් සහ උපරිම යහපතට ගරු කරන්න, විශේෂයෙන් පෞද්ගලික රහස්‍යභාවය සඳහා ඇති අයිතිය ඇතුළත්ව<br><br>➢ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br>➢ කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව</td></tr>
<tr><td>මාධ්‍ය</td><td>1. ළමා වින්දිතයින්ට සාධාරණය ඉටු කිරීමට, දූෂිත නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ සේවා සපයන්නන් සම්බන්ධව විනය ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි අධිකාරීන්ගේ අවධානය යොමු කරවා ගැනීම සඳහා කටයුතු කිරීම<br>2. ළමුන් වෙළඳාම සහ සියලු ආකාරයේ ළමා සූරාකෑම පිළිබඳ ක්‍රමවේදයන් කිසිම ආකාරයකින් නොඉවසන ආකාරයේ වාතාවරණයක් (zero-tolerance) නිර්මාණය කිරීමට සහාය වීම<br>3. කිසිදු තොරතුරක් මඟින් ළමා වින්දිතයින් හඳුනා නොගන්නා බවට සහතික වීමෙන් ළමා වින්දිතයින්ගේ පෞද්ගලිකත්වයට සහ රහස්‍යභාවයට ගරු කිරීම</td></tr>
<tr><td>සිවිල් සමාජ සංවිධාන/ ප්‍රජාව හා</td><td>1. ළමා වින්දිතයින් වෙත ළඟාවීම, ළමුන් වෙළඳාම් කරන මාර්ගයන් හඳුනා ගැනීම සහ අදාළ අධිකාරීන් වෙත නිවැරදි සහ ඉක්මන් තොරතුරු ලබා දීම හරහා අනිසි වෙළඳාම්කරුවන්</td></tr>
</table>

| | |
|---|---|
| **තනි පුද්ගලයින්** | හඳුනා ගැනීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට සහ සේවාවන්වලට සහාය වීම.<br>2. ප්‍රජාව තුළ ළමුන් වෙළඳාම සහ සූරාකෑම පිළිබඳව විමසිලිමත් වන්න. තවද, ඕනෑම ආකාරයක සැක සහිත පුද්ගලයින් හෝ ආයතන පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන්නන් දැනුවත් කරන්න.<br>3. වෙළඳාමට ගොදුරු වූ ළමයින් නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් වෙත හෝ සේවා සපයන්නන් වෙත යොමු කිරීමෙන් ඔවුන්ට සහාය වන්න. |

### 6.4 ළමා වෙළඳාමේ වින්දිතයන් පුනරුත්ථාපනය කිරීම හා නැවත සමාජය සමග ඒකාබද්ධ කිරීම සඳහා වූ වගකීම

වෙළඳාමට ගොදුරු වූවන් පුනරුත්ථාපනය කිරීම හා ඔවුන් නැවත සමාජය සමග ඒකාබද්ධ කිරීම ද ආරක්ෂණ යාන්ත්‍රණයට සමගාමීව සිදුවිය යුතු ය.

| **බැඳී සිටින්නා** | **වගකීම** |
|---|---|
| **රජය හා රාජ්‍ය ආයතන** | ✓ දරුවාගේ උපරිම යහපත සැලකිල්ලට ගනිමින් ළමා වින්දිතයින් පුනරුත්ථාපනය කිරීම සඳහා අදාළ සේවා සපයන්නන්ට පහසුකම් සහ යාන්ත්‍රණ හඳුන්වා දීම.<br>✓ සෑම විටම දරුවන්ගේ නිරුපද්‍රිත බව සහ ආරක්ෂාව සහතික කිරීම.<br>✓ ඔවුන්ගේ තනි පුද්ගල අවශ්‍යතා මත පදනම්ව ජීවන කුසලතා අධ්‍යාපනය, අධ්‍යාපනය හෝ පුහුණුව ස්ථාපිත කිරීම සහ ළමා වින්දිතයින් මෙම පහසුකම් සඳහා ප්‍රවේශ වන බවට සහතික කිරීම.<br>✓ සුදුසු සහ ආරක්ෂිත නම්, ළමා වින්දිතයින් ඔවුන්ගේ ප්‍රජා වෙත ආපසු යැවීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.<br>✓ වෙළඳාමට ගොදුරු වූ ළමයින්ට මනෝ සමාජීය උපදේශනය සැපයීම සහතික කිරීම.<br>✓ කම්පනය මගහරවා ගැනීම සඳහා දරුවා තුළ විශ්වාසය නැවත ගොඩනැගීමට පියවර ගැනීම. |
| **මාධ්‍ය** | වෙළඳාමට ලක්වූ ළමා වින්දිතයින් පිළිබඳ සමස්ත ආකල්පය වෙනස් කිරීමට රජයට සහාය වීම. |
| **සිවිල් සමාජ සංවිධාන/ ප්‍රජව සහ තනි පුද්ගලයන්** | නැවත සමාජය සමග ඒකාබද්ධ කිරීමේ දී පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය හා රාජ්‍ය ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.<br>✓ අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා කටයුතු කිරීම (needs assessments)<br>✓ මනෝ සමාජීය චිකිත්සාව සහ මනෝවිද්‍යාත්මක සහාය ලබා දීම<br>✓ පවුල් නැවත එක් කිරීම<br>✓ ආරක්ෂිත නිවාස සහ මූලික අවශ්‍යතා සැපයීම<br>✓ ළමා වින්දිතයින් සඳහා වෘත්තීය හෝ ජීවන කුසලතා පුහුණු ලබා දීම<br>✓ ආරක්ෂිත නිවාසවල ළමයින් රැකබලා ගන්නන් සඳහා නිරන්තර නිපුණතා පුහුණුවක් ලබා දීම.<br>✓ ළමා වින්දිතයින් සමග රාජ්‍ය නිලධාරීන් විසින් ළමා හිතකාමී සන්නිවේදනය සහ සැලකීම සහිතව මැදිහත් වීම. |

දරුවාගේ අයිතිවාසිකම්වලට **ගරු කරන්න**

දරුවාගේ උපරිම යහපත සඳහා **මූලිකත්වය දෙන්න**

සෑම දරුවෙකුට ම **සමාන සැලකිලි** දැක්වීමට හා ඔවුන්ට **වෙනස්කොට නොසැලකීමට සහතික වන්න**

### 6.5 සහභාගීත්ව සහ අයිතිවාසිකම් පදනම් කරගත් ප්‍රවේශයක් යොදා ගැනීමේ වගකීම

ළමා වෙළඳාම වැළැක්වීම, ආරක්ෂා කිරීම, පුනරුත්ථාපනය කිරීම හා නැවත සමාජගත කිරීම සඳහා රාජය, සිවිල් සමාජය සහ මාධ්‍ය විසින් සහභාගීත්ව හා අයිතිවාසිකම් පදනම් කරගත් ප්‍රවේශයක් අනුගමනය කළ යුතුය. ඒ අනුව, ළමා වෙළඳාම වැළැක්වීම, ළමා වෙළඳාමට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම සහ පුනරුත්ථාපනය කිරීම සඳහා වන මුල පිරීම් සහ

ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී, සියලු පාර්ශවකරුවන් විසින් දරුවාගේ අයිතිවාසිකම්වලට ගරු කිරීමට, දරුවාගේ උපරිම යහපත මෙන්ම සමාන සැලකිලි දැක්වීමට හෝ වෙනස් කොට නොසැලකීමට සිහි තබා ගත යුතු ය.

මීට අමතරව, ළමා වෙළඳාමට ගොදුරු වූවන් හෝ අවදානමට ලක්ව ඇති ළමයින් ආරක්ෂා කිරීම සහ ළමා ජාවාරම වැළැක්වීම සඳහා වන මූල පිරීම් සැලසුම් කිරීමේ දී දරුවන්ට සහභාගී වීමට සහ ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවන් ලබා දිය යුතු ය. විශේෂයෙන් ම පුනරුත්ථාපන හා නැවත සමාජය සමග ඒකාබද්ධ කිරීම පිළිබඳ අවශ්‍යතා තක්සේරු කිරීමේ දී, නැවත පැමිණීම, පුනරුත්ථාපනය කිරීම සහ සමාජය සමග ඒකාබද්ධ කිරීමේ යෝජනා ක්‍රම සංවර්ධනය කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී ළමා වින්දිතයින්ගේ අදහස් සහ දරුවාගේ උපරිම යහපත ගැන සලකා බැලීම සහතික කිරීම අත්‍යවශ්‍ය වේ.

## 6.6 ළමා වෙළඳාම් විරෝධීබව ප්‍රවර්ධනය සහ නැවත සමාජගත කිරීමට වන වගකීම

ඒ හා සමානව, ළමා වෙළඳාමට එරෙහිව සටන් කිරීමට සහ වෙළඳාම්වලට ගොදුරු වූ ළමුන් හෝ අවදානමට ලක්ව සිටින ළමයින්ට යුක්තිය ඉටු කරවා ගැනීම උදෙසා ළමා වෙළඳාමට එරෙහි සහ නැවත සමාජගත කිරීමේ ව්‍යාපාර සහ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍යය, මාධ්‍යය සහ සිවිල් සමාජය සතුව සමාන වගකීමක් ඇත. ළමා වෙළඳාමට රාජ්‍යය සහ ප්‍රජාව දක්වන ප්‍රතිචාරය වැඩිදියුණු කිරීමට සහ ආරක්ෂාව, වැළැක්වීම සහ නැවත ඒකාබද්ධ කිරීම සඳහා අයිතිවාසිකම් පදනම් කරගත් ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීමේ හැකියාව සහ වගකීම මාධ්‍යය සතුව ඇත.

## 6.7 නිගමනය

ළමා වෙළඳාමට ගොදුරු වූවන් හෝ අවදානමට ලක්ව සිටින ළමයින් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත හා සාර්ථක බව සහතික කිරීම සඳහා ළමා වෙළඳාම හෙළා දැකීමට සමාජයේ සෑම කෙනෙකුටම ඍජුව හෝ වක්‍රව වගකීමක් පැවරී ඇත. කෙසේ වෙතත්, ළමා ආරක්ෂණ හා සංවර්ධනයට සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ අනෙකුත් පුරෝගාමී නිලධාරීන් ළමා වෙළඳාම වැළැක්වීම සහ ළමා වෙළඳාමට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම හා පුනරුත්ථාපනය කිරීම සම්බන්ධයෙන් වන වගකීමට පමණක් නොව ඒ සඳහා වගවීමට ද මතක තබා ගත යුතු ය.



**ඉගෙනුම් මෙවලම්**

**ක්‍රියාකාරකම :**

සහභාගිවන්නන් කණ්ඩායම් පහකට බෙදන්න. සෑම කණ්ඩායමක් ම පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගනු ඇත.

1. රාජ්‍යය
2. රාජ්‍ය නොවන සංවිධාන
3. සමාජය/ ප්‍රජාව
4. මාධ්‍ය
5. තනි පුද්ගලයින්

සෑම කණ්ඩායමක් ම තමන් අදාළ පාර්ශවකරුවන් නියෝජනය කරන බව සලකා බැලිය යුතු අතර බැඳීම්, වගකීම් ක්‍රියාත්මක කිරීමේ අභියෝග සහ එක් එක් පාර්ශවකරුවන්ට අනෙක් පාර්ශවකරුවන්ගෙන් ලබා ගත හැකි ආධාර මොනවාද යන්න හඳුනාගත යුතු ය.

සෑම කණ්ඩායමක් ම තමන් හඳුනාගත් දේ ලැයිස්තු ගත කළ යුතු අතර (අවම වශයෙන් කරුණු පහ බැගින්) ඒවා සහභාගීවන්නන්හට ඉදිරිපත් කළ යුතුය

**ක්‍රියාකාරකම:**

මෙම මොඩියුලයට කිරීමට පෙර දින, සහභාගිවන්නන් කණ්ඩායම් පහකට බෙදිය යුතු ය. සෑම කණ්ඩායමක් ම ඕනෑම මාධ්‍යයකින් අනාවරණය කරන ලද දේශීය හෝ විදේශීය ළමා වෙළඳාම් පිළිබඳ සිද්ධියක් තෝරා ගත යුතු ය. මොඩියුලය අවසානයේ, මෙම කණ්ඩායම් විසින් එක් එක් පාර්ශවකරුවන් වෙන් වෙන්ව ගෙන පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් තෝරාගත් සිදුවීම පිළිබඳ සිද්ධි සිතියම් ගත කිරීම කළ යුතු ය.

1. සිද්ධිය වැළැක්වීමට ගත හැකිව තිබූ පියවර
2. ගැටළුව විසඳීම සඳහා සිද්ධියේ ආරම්භයේ සිට අවසානය දක්වා ගෙන ඇති පියවර
3. අනාගතයේ දී මෙවැනි සිදුවීම් තුරන් කිරීම සඳහා ගෙන ඇති හෝ ගත යුතු පියවර.

සෑම කණ්ඩායමකට ම තම සිද්ධි සිතියම්ගත කිරීම අනෙක් අයට ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලැබෙනු ඇත.

# හත්වන මොඩියුලය

| තොරතුරු සමඟ ගනුදෙනු කිරීම | |
|---|---|
| දේශන පැය ගණන | 6 |
| ඇගයීමේ ක්‍රමවේදය | පන්ති සාකච්ඡා සහ නිරීක්ෂණය |
| අධ්‍යයන අරමුණු | මොඩියුලය අවසානයේ සහභාගිවන්නන්ට<br>✓ වැරදිකරුවන් හඳුනා ගැනීමට;<br>✓ ළමයින් වෙළදාම් කිරීමේ සිද්ධීන් හඳුනා ගැනීමට;<br>✓ එලදායී වාර්තා තබා ගැනීමේ ක්‍රම ඉගෙන ගැනීමට;<br>✓ තොරතුරු වාර්තා කිරීමේ ක්‍රම ඉගෙන ගැනීමට; සහ<br>✓ තොරතුරු බෙදා හැරීමට<br>හැකි වනු ඇත |

### a. තොරතුරු ලබා ගැනීම, වාර්තා තබා ගැනීම , වාර්තා කිරීම සහ බෙදා හැරීම

**හැඳින්වීම**

## 7.1 මිනිස් වෙළදාම සම්බන්ධ ශ්‍රී ලංකා නීතිය

දණ්ඩ නීති සංග්‍රහය යනු මානව වෙළදාම යන වරද සිදු කිරීම සම්බන්ධයෙන් වැරදිකරුවෙකු වන තැනැත්තෙකුට එරෙහිව නඩු පැවරීම සඳහා යොදා ගැනෙන දැනට ක්‍රියාත්මක ප්‍රධාන අපරාධ නීතියයි.

2006 අංක 16 දරණ දණ්ඩ නීති සංග්‍රහ (සංශෝධන) පනතේ 2 (2) වගන්තියේ විධිවිධානවලට අනුව, ළමුන් ඇතුළු පුද්ගලයින් වෙළදාම් කිරීමේ වරද සම්බන්ධයෙන් ශ්‍රී ලංකා අධිකරණයට පාරදේශභූමික අධිකරණ බලය පවරා දී ඇත.

අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ පිළිබඳ සම්මුතියට අත්සන් තැබූ රාජ්‍යක් ලෙස, රජය විසින් 2006 අංක 16 දරණ දණ්ඩ නීති සංග්‍රහ (සංශෝධන) පනත පැනවීම මගින් මිනිස් වෙළඳාම පිළිබඳ අතිරේක ප්‍රොටෝකෝලය හා අනුගතව ව්‍යවස්ථාවක් හඳුන්වා දුන්නේය. 360 C (1) වගන්තිය මගින් ළමයින් වෙළදාම් කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපාදන දක්වා ඇත.

**දණ්ඩ නීති සංග්‍රහය**

358 අ වගන්තිය - ණය බැඳුම්කරය, දාසභාවයට පත් කිරීම, බලහත්කාර හෝ අනිවාර්ය වැඩගැනීම, වහල්භාවය සහ යුද්ධයේ යෙදවීම සඳහා ළමයින් බඳවා ගැනීම.

360 අ වගන්තිය – කුට්ටනය

360 ආ (1) වගන්තිය – ළමයින් ලිංගිකව සූරාකෑම

360 ඇ වගන්තිය – තැනැත්තන් වෙළඳාම් කිරීම

360 ඈ වගන්තිය - නීති විරෝධීව දරුකමට හදා ගැනීම් හා අදාළ වැරදි

360 ඉ වගන්තිය – ළමයෙකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීම

**සුවිශේෂී බලාත්මක කිරීම්**

1841 අංක 4 දරණ අයාල ආඥා පනත යටතේ ගැනෙන වැරදි

1889 අංක 5 දරණ ගණිකා නිවාස ආඥා පනත

1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත යටතේ ගැනෙන වැරදි


වෛශ්‍යා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමුන් ජාවාරම් කිරීම වැලැක්වීම සහ ඊට එරෙහිව කටයුතු කිරීම පිළිබඳ සම්මුතිය (තවම ගැසට් කර නොමැත)

**දණ්ඩ නීති සංග්‍රහයේ 360 සී වගන්තිය**

| දණ්ඩ නීති සංග්‍රහය | ක්‍රියාව | කරනු ලබන ආකාරය | අරමුණ | |
|---|---|---|---|---|
| 360 ඇ (1) (අ) | කවුරුන් හෝ, මුදල් හෝ වෙනත් ප්‍රතිශ්‍ය‍ාවක් සඳහා තැනැත්තෙකු<br>• මිලදී ගැනීම<br>• විකිණීම<br>• හුවමාරු කිරීම<br>• මිලදී ගැනීමට, විකිණීමට හෝ හුවමාරුව සඳහා පෙළඹවීම සිදු කරන<br>• මිලදී ගැනීම විකිණීම, හුවමාරුව සඳහා ප්‍රවර්ධනය කිරීමට / පහසුකම් සැලසීමට හෝ පෙළඹවීමට යම් දෙයක් කරන | ඕනෑම මාධ්‍යක් | ඕනෑම අරමුණක් | |

| | | | | |
|---|---|---|---|---|
| 360 (1)<br>(ආ) | • ඕනෑම පුද්ගලයෙකු බඳවා ගැනීම<br>• ඕනෑම පුද්ගලයෙකු ප්‍රවාහනය කිරීම<br>• ඕනෑම පුද්ගලයෙකු මාරු කිරීම<br>• ඕනෑම පුද්ගලයෙකු රඳවා තබා ගැනීම<br>• ඕනෑම පුද්ගලයෙකු බාර ගැනීම<br>• වෙනත් | • බලය<br>• වංචාව<br>• රැවටීම<br>• ප්‍රේරණය භාවිතයෙන්<br>වෙනත් කෙනෙකුගේ අවදානම් සහගත භාවය සූරාකෑම | බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම<br>• වහල්භාවය<br>• පරවශ්‍යතා<br>• අවයව ඉවත් කිරීම<br>• ගණිකා වෘත්තිය<br>• ලිංගික සූරාකෑම<br>• ඕනෑම නීතියක වරදක් වන ඕනෑම ක්‍රියාවක් | තැනැත්තන් වෙළදාම් කිරීම |
| **360** ඇ **(1)**<br>**(**ඇ**)** | • දරුවෙකු බඳවා ගැනීම<br>• දරුවෙකු ප්‍රවාහනය කිරීම<br>• දරුවෙකු මාරු කිරීම<br>• දරුවෙකු සඟවා තබා ගැනීම<br>• දරුවෙකු බාර ගැනීම<br>• වෙනත් | දරුවාගේ කැමැත්ත ඇතිව හෝ නොමැතිව | බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම<br>• වහල්භාවය<br>• පරවශ්‍යතා<br>• අවයව ඉවත් කිරීම<br>• ගණිකා වෘත්තිය<br>• ලිංගික සූරාකෑම<br>• ඕනෑම නීතියක වරදක් වන ඕනෑම ක්‍රියාවක් | |

360C (1) (क्ट)





***තොරතුරු ලබා ගැනීම, වාර්තා තබා ගැනීම, වාර්තා කිරීම සහ බෙදා හැරීම සඳහා ඉගෙනුම් මෙවලම***

- UNICEF: Billion Dollar Business of Child Trafficking (මිනිත්තු 04 ) වීඩියෝ පටය ධාවනය කරන්න - https://www.youtube.com/watch?v=elhX3XGaFsE
- ප්‍රක්ෂේපන තිර - තිර 1 සිට 3 දක්වා (මිනිත්තු 6)
- ප්‍රක්ෂේපන තිර 2 හි සදහන් කතාව වෙත අවධානය යොමු කරන්න (මිනිත්තු 15)
- ප්‍රක්ෂේපන තිර 2 හි සදහන් කතාව වෙත අවධානය යොමු කර මානව වෙළදාම කිරීමේ සිද්ධිය සහ අදාළ නීතියේ විධිවිධාන හඳුනා ගැනීම සඳහා විශේෂයෙන් සඳහනක් දී ඇති උදාහරණය සම්බන්ධයෙන් ඔවුන්ගේ විනිශ්චයන් පිළිබඳව ප්‍රශ්න කරන්න. (මිනිත්තු 10)
- සාකච්ඡාව (මිනිත්තු 10)

සහභාගිවන්නන් කුඩා කණ්ඩායම්වලට බෙදා ඔවුන්ගේ පවතින දැනුම හා අත්දැකීම් මත පදනම්ව මිනිස් වෙළදාමේ මූලිකාංග හඳුනා ගැනීමට ඔවුන්ව මෙහෙයවන්න. එම අංග කොළයක් මත ලියා විවෘත කණ්ඩායම් සාකච්ඡාවේදී සාකච්ඡා කළ යුතුය. (මිනිත්තු 10)

(මිනිත්තු 55)

## 7.2. තොරතුරු ලබා ගැනීම

### අ. පර්යේෂණ ප්‍රොටෝකෝලය

**පසුබිම**

2018, මානව වෙළදාම පිළිබඳ වාර්තාවේ ශ්‍රී ලංකාව මූලික වශයෙන් බලහත්කාරයෙන් ශ්‍රමය හා ලිංගික වෙළදාමට ගොදුරු වූ පිරිමින්, කාන්තාවන් සහ ළමුන් සඳහා ප්‍රභවයක්, ගමනාන්තයක් ලෙසත්, අවම වශයෙන් අතරමැදි ස්ථානයක් ලෙස භාවිතා වන රටක් ලෙසත් සඳහන් කරයි.

ඉදිකිරීම්, ඇඟලුම් හා ගෘහ සේවා අංශවල වැඩ කිරීම සඳහා මැදපෙරදිග, අග්නිදිග ආසියාව සහ ඇෆ්ගනිස්ථානය වෙත සංක්‍රමණය වන ශ්‍රී ලාංකික පිරිමින්, කාන්තාවන් සහ ළමුන් වැඩි වශයෙන් බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීමට සහ ඔවුන්ගෙන් සමහරක් බලහත්කාර ගණිකා වෘත්තියට ද යටත් වන බව අනාවරණය වී ඇත. තවද, ගණිකා නිවාසවල සිදු වන ලිංගික ජාවාරම බොහෝ වෙරළබඩ ප්‍රදේශවල කාන්තාවන් සහ ළමයින් ඊට ගොදුරු කරවයි. ගැහැණු ළමයින්ට වඩා පිරිමි ළමයින් වාණිජ ලිංගිකත්වය හරහා සූරාකනු ලැබේ. සාමාජීය වශයෙන් අවදානම් සහිත ළමුන්ට නගරවල යාචකයන් වීමට හෝ ගෘහ සේවකයන් ලෙස කටයුතු කිරීමට බල කෙරෙන අතර යම් අවස්ථාවලදී ඔවුන් ශාරීරික, ලිංගික හා මානසික අපයෝජනයන්ට ලක් වීම, වැටුප් නොගෙවීම සහ චලනතාවය සීමා කිරීම සිදු වේ.

**අරමුණු**

මානව වෙළදාම වැළැක්වීමේ අරමුණින්, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් ඊට ගොදුරු විය හැකි පුද්ගලයින් හඳුනා ගැනීමේ උත්සාහයන් වැඩි කළ යුතුය. වින්දිතයා හඳුනා ගැනීම වින්දිතයින්ගේ උපරිම යහපත සහතික කිරීම උදෙසා නිවැරදි ස්ථාන සඳහා ඔවුන් යොමු කිරීමේ ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය.

එබැවින් තොරතුරු ලබා ගැනීම, වාර්තා තබා ගැනීම, වාර්තා කිරීම සහ තොරතුරු බෙදා හැරීම සම්බන්ධයෙන් නිලධාරීන් පුහුණු කිරීම අත්‍යවශ්‍ය වේ. ළමයින් වෙළදාම් කිරීමේ සිද්ධීන් හඳුනා ගැනීම සහ එම අවදානමට ලක්ව ඇති ළමුන් හඳුනා ගැනීම සඳහා ළමයින් සමඟ සෘජුව ම කටයුතු කරන නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ගේ ශක්‍යතාවය වර්ධනය කිරීම සඳහා මෙම මොඩියුලය අවශ්‍ය වේ.

ක්‍රමවේදය

මෙම මොඩියුලයේ ඉදිරිපත් කර ඇති තොරතුරු අදාළ ව්‍යවස්ථාදායක නීති, ජාත්‍යන්තර සම්මුතීන් සහ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ නඩු පවරන්නන් සමග සම්මුඛ සාකච්ඡාවලින් ලබා ගන්නා ලදී.

## ආ) සම්මුඛ පරීක්ෂණ ශිල්පීය ක්‍රම

### (i) සම්මුඛ පරීක්ෂණය සඳහා සූදානම් වීම

- අනවශ්‍ය ප්‍රමාදයකින් හෝ අසාමාන්‍ය හදිසියකින් තොරව වින්දිතයාගේ ප්‍රකාශය සටහන් කළ යුතුය.
- වීඩියෝ පටිගත කිරීමට පෙර වින්දිතයා සමග පූර්ව සාකච්ඡාවක් පැවැත්විය යුතු අතර වින්දිතයා පුහුණු නොකරන ලෙස සම්මුඛ පරීක්ෂකවරයාට අනතුරු ඇඟවිය යුතු ය.
- වින්දිතයාට ඇයට/ ඔහුට පහසු පුද්ගලයෙකු සමග ඇසුරු කිරීමට ඉඩ දෙන්න. සුදුසු නම් ළමා මනස වටහා ගත හැකි, උපදේශකයෙකු යනාදී වශයෙන්.
- සම්මුඛ පරීක්ෂණයට පෙර වින්දිතයා ළමා මනෝ විද්‍යාඥයෙකු වෙත ඉදිරිපත් කළ යුතු ය.
- වින්දිතයා කිසිදු වේලාවක හුදෙකලා නොකළ යුතු ය. ක්‍රියාවලිය අතරතුර, මැදිහත්වීම් හෝ වෙනත් බාධා කිරීම් වළක්වා ගත යුතු ය.
- අවශ්‍ය නම් අවස්ථාපිත සාධක මත කාන්තා පොලිස් නිලධාරීන්ගේ සහාය ලබා ගත යුතු ය.
- සම්මුඛ පරීක්ෂණයේදී ආවරණය කළ යුතු කරුණු සම්බන්ධයෙන් ලැයිස්තුවක් සකස් කළ යුතු ය.
- මෙම ලැයිස්තුවට;
  - සිදුවීම් මාලාව,
  - සිද්ධිමය සාධක
  - වැරදිකරුවන් හඳුනා ගැනීම පිළිබඳ දේ ඇතුළත් විය හැකිය.

### (ii) සම්මුඛ පරීක්ෂණය අතරතුර

- සම්මුඛ පරීක්ෂණයේ ප්‍රගති සමාලෝචනයේදී දී නව කරුණු හා සිදුවීම් මතු කරවීමට සම්මුඛ පරීක්ෂකවරයාට හැකි විය යුතු ය.
- සම්මුඛ පරීක්ෂක විසින් වින්දිතයාගේ භාෂාවෙන් ප්‍රකාශය සටහන් කළ යුතු ය.
- සම්මුඛ පරීක්ෂක විසින් නිරීක්ෂණය කරන ලද පරිදි වින්දිතයාගේ ශරීර භාෂාව සහ චිත්තවේගීය වෙනස ඉස්මතු කර වාර්තා කළ යුතු ය.
- සම්මුඛ පරීක්ෂක විසින් අසනු ලබන ප්‍රශ්න අවශ්‍ය තරම් සරල හා කෙටි විය යුතු අතර, එය කම්පනයෙන් මිදීමට සහ නිසි ලෙස, සංවේදීව හා සම්පූර්ණයෙන් සිදුවීම් සිහිපත් කිරීමට වින්දිතයාට උපකාර කළ යුතු ය.
- භාවිතා කරන භාෂාව සහ පාරිභාෂිතය වින්දිතයාට තේරුම් ගත හැකි විය යුතු ය. සම්මුඛ පරීක්ෂණය අතරතුර, සම්මුඛ පරීක්ෂකවරයා කිසිදු අදහස් දැක්වීමක් හෝ විවේචනයක් නොකළ යුතු ය.
- නඩු විභාගයේදී ප්‍රතිවිරෝධතා පැවතීම අවම කිරීම සඳහා පටිගත කරන ප්‍රකාශ ගණන අවම කළ යුතු ය.
- වින්දිතයින් අපරාධයක් කර ඇති බවට ව්‍යාජ හැඟීමක් ලබා දීමෙන් වින්දිතයින් තුළ භීතිය ඇති කිරීම සඳහා ජාවාරම්කරුවන් ව්‍යාජ තොරතුරු සපයයි. එමනිසා සම්මුඛ පරීක්ෂකවරයා වින්දිතයාට වින්දිතයා තමා ය යන බව වටහා දිය යුතු අතර ඔහු/ ඇය අත්අඩංගුවට ගැනීමකට ලක් කළ හැකි වරදක් නොමැති බව පහදා දිය යුතු ය.
- ප්‍රකාශය සවිස්තරාත්මක විය යුතු අතර එය තාර්කික විය යුතු මෙන්ම වෙළඳාමේ සහ සූරාකෑමේ සියලු අංග ආවරණය කළ යුතු ය.

➢ තවද, සූරාකෑමේ ප්‍රවර්ගය, වෙළඳාම් කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ විවිධ පුද්ගලයින්ගේ භූමිකාව සහ ඔවුන්ගේ අනන්‍යතාවය සහ සමස්ත සිදුවීම් දාමය වැනි තොරතුරු රැස් කිරීම කෙරෙහි සම්මුඛ පරීක්ෂකවරයා අවධානය යොමු කළ යුතු ය. (වින්දිතයාට නමෙන් වැරදිකරුගේ අනන්‍යතාවය හෙළි කිරීමට නොහැකි විය හැකි නමුත්, නඩු විභාගයේ දී ප්‍රයෝජනවත් වන වැරදිකරුවෙකුගේ විශේෂ භෞතික ලක්ෂණ ආදිය හඳුනා ගැනීමට හැකි වනු ඇත. ඇඳුම්, ස්වර්ණාභරණ ආදි සැලකිය යුතු ය. )

**(iii) වින්දිතයා සම්මුඛ පරීක්ෂණයට ලක් කිරීමෙන් පසු**

➢ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමේ වින්දිතයාගේ උත්සාහය අගය කිරීමට වග බලා ගන්න.

➢ වින්දිතයාට ශාරීරික හා මානසිකව සිදු වූ සිදුවීම් සිහිපත් කිරීමෙන් ද්විතීයික හිංසනයට ලක්විය හැකි බැවින් සම්මුඛ සාකච්ඡා නැවත කිරීම සහ නැවත සිදුකිරීමට සැලසුම් කිරීම වළක්වා ගැනීම ඉතා වැදගත් වේ.

➢ වැරදිකරුට සහ වින්දිතයාට එකම වාහනයක ගමන් කිරීමට බල නොකළ යුතු ය. නැතහොත් වින්දිතයාට වෙනත් වැරදිකරුවන් සමඟ බන්ධනාගාර බස් රථයක ගමන් කිරීමට බල නොකළ යුතු ය. ඔවුන් දරුවන් වන බැවින් වැරදිකරු නිතර දැකීමෙන් වින්දිතයාගේ මානසික තත්ත්වයට බලපෑම් ඇති විය හැකි අතර එය තමාම වැරදිකරුවෙකු ලෙස හැඟීමට බල පෑ හැකි ය.

**(iv) ) ළමා වින්දිතයින්ගේ සම්මුඛ සාකච්ඡාවල විශේෂ ලක්ෂණ**

➢ සම්මුඛ පරීක්ෂණයට පෙර අතරතුරදී සහ පසුව ආහාර, ජලය, තේ, සනීපාරක්ෂක සැපයුම් ආදිය ලබා දීමෙන් වින්දිතයාගේ සැපපහසුකම් රැක බලා ගත යුතු ය.

➢ ළමා වින්දිතයින්ට විශේෂ ආහාර තෝරා ගැනීම වැනි විශේෂ අවශ්‍යතා සැපයිය යුතු ය.

➢ සම්මුඛ පරීක්ෂණ ස්ථානය වින්දිතයාට සුවපහසු විය යුතු ය. ළමයින්ට හිතකාමී වාතාවරණයක් පවත්වා ගත යුතු ය.

➢ වින්දිතයා කැඳවාගෙන එන පුද්ගලයාගේ ප්‍රකාශය සටහන් කළ යුතු ය.

ළමා වින්දිතයින්ගේ ප්‍රකාශය ලිඛිත ප්‍රකාශයකට වඩා වීඩියෝ පටිගත කිරීමක් ලෙස පටිගත කිරීමට පොලිසිය ප්‍රවේශම් විය යුතු අතර විමර්ශකයින්ට යටිතල පහසුකම් ලබා දිය යුතු ය. සිද්ධියට මුහුණ දුන් තැනැත්තාගේ සැබෑ නැවුම් හැසිරීම පිළිබිඹු කරන උසස් තත්ත්වයේ වීඩියෝ පටිගත කිරීමක් භාවිතා කිරීමට උත්සාහ කළ යුතු ය.

**සටහන** - කරුණාකර 4 සිට 8 දක්වා වන ප්‍රක්ෂේපන තිර බලන්න
තම අත්දැකීම් මත දරුවෙකු සම්මුඛ පරීක්ෂණයට ලක් කිරීම නිරූපණය කිරීමට සහභාගිවන්නන් දෙදෙනෙකුට ආරාධනා කරන්න
සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලිය අදියර තුනකට බෙදීමෙන් සම්මුඛ පරීක්ෂණ ක්‍රමවේදයන් ඉස්මතු කරන්න: 1. සම්මුඛ පරීක්ෂණයට පෙර 2. සම්මුඛ පරීක්ෂණය අතරතුරේදී 3. සම්මුඛ පරීක්ෂණයෙන් පසුව
ළමා වින්දිතයින්ගේ සම්මුඛ පරීක්ෂණයේ විශේෂ ලක්ෂණය අවසාන කරුණ ලෙස සාකච්ඡා කළ යුතු අතර ළමා වින්දිත ප්‍රකාශයේ වීඩියෝ පටිගත කිරීමේ වැදගත්කම ඉස්මතු කළ යුතු ය. (ළමා වින්දිතයින් වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයින් ය. විමර්ශනය අවසන් කිරීමෙන් පසු අපරාධ නඩු පැවරීමට අවම වශයෙන් අවුරුදු 2-3 කට වඩා ගත වේ. සමහර අවස්ථාවල වින්දිතයාට මතකය නොමැතිකම හේතුවෙන් සිද්ධිය සිහිපත් කළ නොහැක. එවැනි අවස්ථාවල නඩු පැවරීමේදී නඩුව පටිගත කිරීම මහගු උපකාරයක් වේ)



***තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉගෙනුම් මෙවලම්***

**ආ. පර්යේෂණ ප්‍රොටෝකෝලය -** (මිනිත්තු 15)

මොඩියුලය 7 පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම

**ආ. සම්මුඛ පරීක්ෂණ ශිල්පීය ක්‍රම**

- සහභාගිවන්නන් දෙදෙනෙකුගේ සහාය ඇතිව එක් අයෙකු වින්දිතයා ලෙස සහ අනෙකා සම්මුඛ පරීක්ෂක ලෙස නිරූපණය කිරීම
- කරුණාකර 4 සිට 7 දක්වා ප්‍රක්ෂේපන තිර වෙත යොමු වන්න (ප්‍රක්ෂේපන තිරයකට මිනිත්තු 10)
- ප්‍රක්ෂේපන තිර 8 සඳහා (මිනිත්තු 15)

- ළමා වින්දිතයෙකුගේ සම්මුඛ සාකච්ඡාවක විශේෂ ලක්ෂණ පිළිබද සහභාගිවන්නන් සමඟ පළමු සාකච්ඡාව

- ඔවුන්ගේ අදහස් ලැයිස්තු ගත කිරීමට ෆ්ලිප් බෝඩ් භාවිතා කරන්න (මිනිත්තු 15)

- ඉන්පසු මොඩියුලයේ ***7.2.1.b (iv)*** කොටස බලන්න. (මිනිත්තු 10)

මිනිස් වෙළඳාම යනු කුමක්ද යන්න පිළිබඳ වීඩියෝ පටයක් වාදනය කරන්න

https://www.youtube.com/watch?v=DWoHgIoLCPg

(මිනිත්තු 65)

**ඇ. සදාචාරාත්මක ගැටළු**

"ආචාර ධර්ම" සදාචාරාත්මක මූලධර්ම ලෙස අර්ථ දක්වා ඇති අතර සෑම තත්ත්වයකදී ම දෙන ලද සන්දර්භයක් තුළ ඇති හරි වැරැද්ද තීරණය කිරීමට අවශ්‍ය වේ. ළමා වින්දිතයෙකු සම්බන්ධ අපරාධ පරීක්ෂණයකදී භාවිතා කරන සම්මුඛ පරීක්ෂණ ක්‍රම "'දරුවාගේ උපරිම යහපත" සැලකිල්ලට ගත යුතු ය.

නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ වෘත්තීය ආචාර ධර්ම පාලනය කරන ආයතනික යාන්ත්‍රණයක් හෝ නීති පැනවීමක් නොමැත.

වෛද්‍ය ආඥා පනතේ වෛද්‍ය වෘත්තිකයන්ගේ ආචාර ධර්ම පද්ධතිය. දක්වා ඇත[83].

- ➢ පළමු පියවර ලෙස, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරියෙකු මූලික ළමා අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් විය යුතු ය.
- ➢ ළමා වින්දිතයාගේ වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය, ජාතිය, ජනවාර්ගිකත්වය, සංස්කෘතිය, ජාතික සම්භවය, ආගම, ලිංගික දිශානතිය, ආබාධිතභාවය, භාෂාව හෝ සමාජ ආර්ථික තත්ත්වය ගරු කළ යුතු අතර සලකා බැලිය යුතු ය. ඔහු/ ඇය පරිවාස නිවාසයේ තැබීමේදී ද මෙම කරුණු වැඩිදුර සලකා බැලිය යුතු ය.

| ළමා වින්දිතයාගේ තොරතුරු<br>වයස අවුරුදු 15 යි. කුරුණෑගල ජීවත් විය.<br>ඇය 26 හැවිරිදි කුමාර සමඟ ප්‍රේම සම්බන්ධයක් පවත්වාගෙන ගියාය.<br>ඇය කුමාර සමඟ පැන ගොස් ඔහු සමඟ ලිංගික සංසර්ගයේ යෙදුණාය.<br>පොලිසිය විසින් කොළඹ ගණිකා නිවාසයක සිදුකරන ලද වැටලීමක දී මේ වන විට අත්අඩංගුවට ගෙන තිබේ. | සම්මුඛ පරීක්ෂක දරුවාගේ හැසිරීම විවේචනය නොකළ යුතු<br>→ | උදාහරණය : වින්දිතයා දෙමළ ජනවාර්ගිකයෙක් නම්, එය පරිවාසය තුළ දී වුවද ඇය/ ඔහුට සෑම විටම දෙමළ කතා කරන නිලධාරීන්ට ප්‍රවේශය ලබා දිය යුතු ය. |
|---|---|---|

---

[83] 1927 ශ්‍රී ලංකා වෛද්‍ය ආඥා පනත

- සම්මුඛ පරීක්ෂණ නිලධාරියා ළමුන් සම්බන්දව සංවේදී විය යුතු අතර වින්දිතයාට සිදුවූ දේ විවේචනය කිරීම හෝ විනිශ්චය කිරීම නොකළ යුතු ය.
- ළමයෙකු සමඟ සන්නිවේදනය කිරීමේදී කණිෂ්ඨ පොලිස් නිලධාරීන් සෑම විටම ජ්‍යෙෂ්ඨ නිලධරයකු (සහකාර පොලිස් අධිකාරී හෝ ඊට ඉහළ) විසින් අධීක්ෂණය කළ යුතු ය. දරුවාගේ ආරක්ෂාව ඇතුළුව දරුවාගේ උපරිම යහපත පිළිබඳ මූලධර්මය මතකයේ තබා ගනිමින් තොරතුරු මුදා හැරීම කළ යුතු ය.
- ළමා ආරක්ෂාව සහතික කිරීම සඳහා සෑම විටම ඉහළ මට්ටමේ වෘත්තීය මට්ටමක් පවත්වා ගත යුතු ය.
- එවැනි කැමැත්ත ලබා නොගෙන කරන ක්‍රියාකාරකම් සිදු කිරීම නීතියෙන් හෝ රජයේ රෙගුලාසි මගින් හෝ වෙනත් ආචාර ධර්ම සංග්‍රහයක දක්වා ඇති පරිදි (උදාහරණ මාධ්‍යවේදීන් සඳහා ආචාර ධර්ම සංග්‍රහය) සිදු කිරීමට නියම කර ඇති විටක හැර අවශ්‍ය නම්, සියලු ආකාර සන්නිවේදනයන්හි දී දරුවාගේ දැනුවත්භාවයෙන් යුතුව ලබාදෙන කැමැත්ත දරුවාට සාධාරණ ලෙස තේරුම් ගත හැකි භාෂාවකින් පැහැදිලි කර දී ලබා ගත යුතු ය.
- විමර්ශනය තුළින් ලබාගත් සංවේදී තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා සාධාරණ පියවර ගැනීමට නිලධාරීන්ට / විමර්ශකයින්ට මූලික වගකීමක් ඇත.
- ළමා වින්දිතයාට දයානුකම්පාවෙන් හා ගෞරවයෙන් සැලකිලි ලැබීමට හිමිකමක් ඇත.



***<u>සදාචාරාත්මක ගැටළු සඳහා මෙවලම්</u>***

නිදසුනක් ලෙස, දෙන ලද අවස්ථාවක දී, වින්දිතයාගෙන් ඇසිය යුතු සහ වින්දිතයාගෙන් නොඇසිය යුතු ප්‍රශ්න ලැයිස්තුගත කිරීමට සහභාගිවන්නන් යොමු කරන්න. (මිනිත්තු 30 )

<u>ළමා වින්දිතයාගේ තොරතුරු</u>

වයස අවුරුදු 15 යි. කුරුණෑගල ජීවත් විය.

ඇය 26 හැවිරිදි කුමාර සමඟ ප්‍රේම සම්බන්ධයක් පවත්වාගෙන ගියාය.

ඇය කුමාර සමඟ පැන ගොස් ඔහු සමඟ ලිංගික සංසර්ගයේ යෙදුණාය.

පොලිසිය විසින් කොළඹ ගණිකා නිවාසයක සිදුකරන ලද වැටලීමකදී මේ වන විට අත්අඩංගුවට ගෙන තිබේ.

වින්දිතයාගෙන් ඇසිය යුතු සහ
වින්දිතයාගෙන් නොඇසිය යුතු ප්‍රශ්න
මොනවාද? (මිනිත්තු 20 )

- ඉහත දක්වා සිද්ධිය මත පදනම්ව විවෘත සාකච්ඡාවක් සහ ලබා දී ඇති තත්ත්වය පිළිබඳ ඔවුන්ගේ අවබෝධය පිළිබඳව සහභාගිවන්නන්ගෙන් විමසන්න. (මිනිත්තු 10)

ප්‍රක්ෂේපන තිර 10, 11
සාකච්ඡාව ගොඩනගන්න

(මිනිත්තු 60 )

## 7.3 තොරතුරු පටිගත කිරීම

### අ. දත්ත හැසිරවීම සහ ගබඩා කිරීම

මිනිස් වෙළදාම සංක්‍රාන්ති අපරාධයකි. අපරාධ කළමනාකරණයට සහ නිවාරණ ක්‍රම දියුණු කිරීමට දත්ත පදනමක් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.

I. **පොලිස් අපරාධ වාර්තා අංශය** (CRD)

අන්තර්ජාතික සංක්‍රමණ පිළිබද අන්තර්ජාතික සංවිධානයේ (IOM) තාක්ෂණික සහාය ඇතිව ශ්‍රී ලංකාවේ පොලිස් අපරාධ වාර්තා අංශය (CRD) 2009 ඔක්තෝම්බර් මාසයේදී සවිස්තරාත්මක හා මධ්‍යම දත්ත එක්රැස් කිරීමේ පද්ධතියක් ස්ථාපිත කරන ලදී. මෙම දත්ත ගබඩාව මිනිස් වෙළදාම පිළිබඳ අදාළ දත්ත එක්රැස් කරන අතර ඒ පිළිබඳ සිද්ධි ලුහුබැඳ යාමට සහ නඩු පැවරීමට නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට සහාය වේ.

II. **ඇඟිලි සලකුනු රෙජිස්ට්‍රාර්**

ඇඟිලි සලකුනු රෙජිස්ට්‍රාර් විසින් ඇඟිලි සලකුණු පිළිබඳ සීමිත දත්ත පදනමක් පවත්වා ගෙන යන අතර එහි ක්‍රියාකාරිත්වය පාලනය වන්නේ අපරාධ වැළැක්වීමේ ආඥා පනත මගිනි. ආඥා පනතට අනුව, එකී ආඥා පනතේ උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් දෝෂදර්ශනයට ලක්කරන ලද වූ සැකකරුවන්ගේ ඇඟිලි සලකුණු ලේඛනයක් තබා ගැනීමට අවසර ඇත. එකී පනතට ගෙනෙන ලද සංශෝධනයක් මගින් මිනිස් වෙළදාම එම උප ලේඛනයට හඳුන්වා දෙන ලදී[84].

නීතිය ක්‍රියාත්මක කිරීමේ දී ඇති ප්‍රධාන බාධකවලින් එකක් වන්නේ දත්ත පදනමක් නොමැතිකමයි. ශ්‍රී ලංකාවේ අපරාධ සඳහා දත්ත පදනමක් ස්ථාපිත කිරීම මිනිස් වෙළදාම කෙරෙහි පමණක් නොව සියලු ආකාරයේ අපරාධ සඳහා ද ඉතා වැදගත් වන්නේ ය. පොලිසිය දැනටමත් අපරාධ පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තා කර ඇති හෙයින්, අපරාධයට අදාළ පාර්ශවයන්ගේ තොරතුරු ද එකම දත්ත ගබඩාවට ඇතුළත් කළ හැකි ය. මෙම වාර්තාකරණ පද්ධතිය අපරාධ නඩුවල දී ජාතික හා කලාපීය වශයෙන් වර්ධනය කළ හැකි ය. දැනටමත් පවතින පොලිස් වාර්තාවල සංඛ්‍යාලේඛන සම්පාදනය කර ඇති බැවින්, ඇරීමට ඇති එකම අතිරේක පිරිවැය වනුයේ විශ්ලේෂණය, ඇගයීම සහ බෙදා හැරීමේ පිරිවැයයි. අපරාධ පිළිබඳ දත්ත සමුදාය අපරාධ විමර්ශන බුද්ධි ඒකකයන්ට පහසුකම් සපයන අතර එය වැළැක්වීමේ ක්‍රම දියුණු කිරීමට සහ මිනිස් වෙළදාමට එරෙහිව සටන් කිරීම සඳහා බුද්ධි තොරතුරු බෙදා ගැනීමට එය උපකාරී වේ.

**<u>පොලිස් දෙපාර්තමේන්තුවේ දැනට පවත්නා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමයේ වාසි සහ අවාසි</u>**

| වාසි | අවාසි |
|---|---|
| අපරාධ පසුබිම් පරීක්ෂාවක් පහසුවෙන් පැවැත්විය හැකි වීම | නිවරද්‍ය නොවන දත්ත ඇතුළත් කිරීම් මානව දෝෂ |
| හොඳ දත්ත සන්නිවේදන පද්ධතියක හැකියාව | ව්‍යාජ තොරතුරු ගබඩා කිරීමේ හැකියාවන් |
| වැළැක්වීමේ ක්‍රම ක්‍රියාත්මක කිරීම | අනවසර වෙනස් කිරීම |
| සැකකරුවන් හඳුනා ගැනීමට සහාය වීම | දත්ත සොරකම් කළ හැකිය |
| වෙනත් රටවල් සමඟ තොරතුරු බෙදා ගැනීම පහසුය | රහස්‍යභාවය සහ පෞද්ගලිකත්වය පිළිබද ගැටළු |

---

[84] 2017 අංක .29 දරන පනත 18.11.2017 දින සිට බලාත්මක කරන ලදී



*දත්ත පටිගත කිරීමේ මෙවලම්*

1. **දත්ත හැසිරවීම සහ ගබඩා කිරීම (මිනිත්තු 20)**

- සාකච්ඡාව කණ්ඩායම් සාකච්ඡාවක් ලෙස පවත්වන්න.

ප්‍රක්ෂේපන තිරය 12

- මතක අවදි කිරීම - දත්ත රැස් කිරීම වැඩි දියුණු කිරීම සඳහා අදහස් ෆ්ලිප් පුවරුවේ ප්‍රදර්ශනය කරන්න. (මිනිත්තු 15)
- සහභාගිවන්නන් සමග වාසි සහ අවාසි සාකච්ඡා කරන්න (මිනිත්තු 10)
- පවතින පද්ධතිය පිළිබඳ ප්‍රතිපෝෂණ සැසියක් පවත්වන්න. (මිනිත්තු 15)

පක්ෂේපන තිරය 13

(මිනිත්තු 45)

## 7.4 තොරතුරු වාර්තා කිරීම සහ බෙදා හැරීම

### a. තොරතුරු වලංගු කිරීම, වාර්තා කිරීම සහ බෙදා හැරීම

#### (i) තොරතුරු වලංගු කිරීම

තොරතුරු බෙදා හැරීමට පෙර වෙනත් ආයතන සමග සන්නිවේදනය කිරීමට අදහස් කරන කරුණු හෝ දත්තවල වලංගුබාවය තහවුරු කර ගැනීම වැදගත් වේ.

- දත්ත වලංගු කිරීම සඳහා, උපයෝගීතා පරීක්ෂණ හරහා දත්ත ධාවනය කිරීම වැනි සුදුසු පරීක්ෂණ ක්‍රියාත්මක කළ යුතු ය.
- අවිධිමත් දත්ත වලංගු කිරීම සඳහා, තොරතුරු ස්ථාපිත කිරීම සහ සත්‍යාපනය කිරීම සඳහා සුදුසු වැඩිදුර විමර්ශන ක්‍රම භාවිතා කළ හැකි ය.
- අන් අයගෙන් ලැබුණු ඕනෑම දත්තයක් වලංගු කිරීම සඳහා, ඔබට අවශ්‍ය කුමන තොරතුරු ද යන්න පිළිබඳව ඔබට පැහැදිලි බව කලින් සහතික කර ගන්න.

#### දත්ත වලංගු කිරීමට උපදෙස්

1. තොරතුරු වලංගුභාවය සහ නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා නිලධාරීන්ගේ අත්දැකීම් සහ ඔවුන්ගේ දැනුම හා කුසලතාව භාවිතා කරන්න. එසේම ස්වාධීන මූලාශ්‍රයන් ඇසුරෙන් තවත් තහවුරු කල හැකි උපකාරී සාක්ෂි රැස් කරන්න.

| |
|---|
| දරුවා සමග එන පුද්ගලයාගේ ප්‍රකාශය (උපකාරී සාක්ෂි)<br>විමර්ශන සටහන් නිවැරදිව වාර්තා කිරීම සහ අපරාධ සිදුවීම් නිරීක්ෂණය කිරීම. |

2. තොරතුරු අවශ්‍යතා සපුරාලන බවටත් තොරතුරු අදාළ බවටත් වග බලා ගන්න.

| |
|---|
| වරදකරු හඳුනා ගැනීම අවශ්‍ය වන තොරතුරු (ශරීරයේ ඇති පච්ච සලකුණු, ඇඳුම් ආදී ) |

3. තොරතුරු සංවිධානය කිරීම

| |
|---|
| එක් සිද්ධියක් සඳහා එක් ගොනුවක් (ෆෝල්ඩරයක්) භාවිතා කරන්න, පහසු යොමු කිරීම සඳහා තොරතුරු පොත් අංක ලැයිස්තුගත කරන්න |

**III. බෙදා හැරීම**

- උසස් නිලධාරියෙකු විසින් තොරතුරු තහවුරු කර ඇති බවට සහ අනුමැතිය ලබා දී ඇති බවට සහතික වන්න (තොරතුරු බෙදා හැරීමට පෙර). විශේෂයෙන් ගෝලීය වශයෙන් තොරතුරු බෙදා හැරීමට ඔබට සිදුවුව හොත් දත්ත වලංගු කරන්න.
- කෙසේ වෙතත් තොරතුරු බෙදා හැරීම සඳහා වන සංවර්ධනය කරමින් පවතින ක්‍රියා පටිපාටියක් නොමැත.

***b*. සාමාන්‍ය ජනතාවට අදාළ බලධාරීන් වෙත තොරතුරු සැපයිය හැකි ආකාරය**

ශ්‍රී ලංකාවේ ඕනෑම පුද්ගලයෙකුට අපරාධයක් වාර්තා කිරීමට හෝ ආධාර ලබා ගැනීමට 119 අංකයෙන් පොලිස් හදිසි පාලන අංශය ඇමතිය හැකි ය. 2004 ට පෙර ශ්‍රී ලංකාවේ සංවිධානාත්මක පොලිස් හදිසි සේවාවක් නොතිබුණි. 2004 ට පෙර
011-2433333 හරහා හදිසි සේවය ලබා දී ඇත්තේ පුරවැසියන්ට (විදේශිකයන් ද ඇතුළුව) පමණි.

මෙම හදිසි ඇමතුම් මධ්‍යස්ථානය පිහිටා තිබුණේ පොලිස් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ ය. පොලිස් හදිසි සේවය (119) 2004 නොවැම්බර් 8 වන දින මිරිහාන පිහිටි පොලිස්පතිවරයාගේ අණදෙන හා තොරතුරු අංශයේ පිහිටුවන ලදී. එතැන් සිට, මෙම සේවාව හදිසි අවස්ථාවක දී 119 ඇමතීම සඳහා ඕනෑම තැනැත්තෙකුට පහසුකම් සපයන අතර, එහිදී පොලිස් ප්‍රතිචාර කණ්ඩායම වහාම එම ස්ථානයට පැමිණෙනු ඇත.

**තවද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (NCPA) විසින් වෙළදාමට කිරීමේ වැඩි අවදානමක් ඇති ළමුන් හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර තිබේ. මෙම පද්ධතියට ගම් මට්ටමින් අනතුරු ඇඟවීම් කණ්ඩායම් සහ පාසල් ළමා ආරක්ෂක කමිටු ඇතුළත් වේ. එසේම NCPA හදිසි ඇමතුම් අංක 1929 හරහා ළමා අපයෝජන වාර්තා කිරීම සඳහා මහජනතාවට ක්ෂණික සහාය ඉල්ලා සිටිය හැකි ය.**

මහජනතාවට **1938** හරහා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයෙන්ද සහාය ඉල්ලා සිටිය හැකි ය.

0112369800 හදිසි ඇමතුම් අංකයෙන් මහජන පැමිණිලි කම්කරු දෙපාර්තමේන්තුවේ ළමා හා කාන්තා අංශය වෙත ද යොමු කළ හැකි ය.

**ඈ. රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය නොවන සංවිධාන, මාධ්‍ය වෙත තොරතුරු මුදා හැරීම සලකා බැලීම සහ මහජනතාවගේ පෞද්ගලිකත්වය සහ ආරක්ෂණ ගැටළු**

මිනිස් වෙළදාම පිළිබඳ සංකීර්ණ ගැටලුවට එරෙහිව සටන් කිරීම සඳහා අදාළ සියලු බලධාරීන්ගේ බහු-ආංශික සහභාගීත්වයේ වැදගත්කම අවබෝධ කරගත් ශ්‍රී ලංකා රජය, අධිකරණ අමාත්‍යාංශයේ නායකත්වය යටතේ සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහ සංක්‍රමණ සඳහා වන අන්තර්ජාතික සංවිධානයේ තාක්ෂණික සහය යටතේ සියලු ම පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය වැඩි කිරීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා ඇත. එබැවින් 2010 ඔක්තෝම්බර් මාසයේ දී ජාතික මිනිස් වෙළදාම මර්දන කිරීමේ ජාතික කාර්ය සාධක බලකායක් දියත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ මානව වෙළඳාම විසඳීම සඳහා ගනු ලබන සියලු මුලපිරීම් සම්බන්ධීකරණය කිරීම සඳහා ප්‍රමුඛ රාජ්‍ය ආයතනය වන්නේ අධිකරණ අමාත්‍යාංශයයි. මානව වෙළඳාම පිළිබඳ ගැටලුව ආමන්ත්‍රණය කිරීමේ දී සියලු ප්‍රධාන පාර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණය හා සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය 2010 දී මිනිස් වෙළඳාම් මර්දනය කිරීමේ ජාතික කාර්ය සාධක බලකායක් පිහිටුවා තිබේ. කාර්ය සාධක බලකායේ සාමාජිකයින් මාසිකව රැස්වී තොරතුරු හා යහ භාවිතයන් සම්බන්ධව සහභාගී වන පාර්ශ්වකරුවන් අතර තොරතුරු බෙදා ගනී. දුරකථනः +94 (0) 11532 5300

රජයේ ප්‍රධාන පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම, නඩු පැවරීම්වල සාර්ථකත්වය ප්‍රවර්ධනය කිරීම සහ වින්දිතයින්ගේ ආරක්ෂාව වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් මෙම කාර්ය සාධක බලකාය දියත් කරන ලදී. වැළැක්වීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේදී ද කාර්ය සාධක බලකාය ප්‍රයෝජනවත් වනු ඇත. මූලික රාජ්‍යමය කොටස්කරුවන් අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමේ අදහසින් මෙම විශේෂ කාර්ය බලකාය පිහිටුවන ලදී.

කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වන්නේ ;

- විදේශ කටයුතු අමාත්‍යාංශය
- ආරක්ෂක අමාත්‍යාංශය
- කාන්තා කටයුතු හා ළමා සංවර්ධන අමාත්‍යාංශය,
- නීතිපති දෙපාර්තමේන්තුව
- කම්කරු අමාත්‍යාංශය
- සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශය
- අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව
- පොලිස් අපරාධ අංශය
- ආගමන හා ආගමන දෙපාර්තමේන්තුව
- පොලිස් කාන්තා හා ළමා කාර්යාංශය
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
- පොලිස් අපරාධ වාර්තා අංශය
- පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
- ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරී

- තවද, අධිකරණ අමාත්‍යාංශය, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, කම්කරු සබඳතා අමාත්‍යාංශය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, සේවක හා සේවා යෝජකයන්ගේ සංවිධාන සහ සිවිල් සමාජ සංවිධාන ඇතුළු අදාළ රාජ්‍ය ආයතනවල නියෝජිතයින්ගෙන් සමන්විතව කම්කරු දෙපාර්තමේන්තුව විසින් 'ළමා ශ්‍රමය වැළැක්වීම සහ තුරන් කිරීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවක්' යන අන්තර් ආංශික උපදේශක කමිටුවක් පිහිටුවන ලදී. ළමා ශ්‍රමයේ නරකම ආකාර පිළිබඳ ශ්‍රී ලංකාවේ මග සිතියම 2016 සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු කිරීමට කමිටුව පිහිටුවන ලදී. මේ මගින් ගැටුම්වලින් පීඩාවට පත් කලාපවල, වතු කලාපවල සහ දුප්පත් ග්‍රාමීය ප්‍රදේශවල ළමයින් වෙළඳාමට ලක් වීමට සහ ශ්‍රම සූරාකෑමේ හා ගණිකා වෘත්තියට ගොදුරු වීමට වැඩි අවදානමක් ඇති අය ලෙස හඳුනා ගනී. 2010 ඔක්තෝම්බර් මාසයේ දී පිහිටුවන ලද ජාතික මෙහෙයුම් කමිටුව සාමාජිකයින් අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කර ඇති අතර, එහි සාමාජික සංවිධානවල ප්‍රතිපත්ති හා වැඩසටහන් තුළට ළමා ශ්‍රම ගැටලු ආදී කරුණු ආමන්ත්‍රණය කළ හැකි ක්‍රමවේද ඒකාබද්ධ කිරීමට පහසුකම් සපයයි.
- අධිකරණ අමාත්‍යාංශය ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ එක්ව 2010 මාර්තු මාසයේදී පුද්ගලයින් වෙළඳාම් කිරීම පිළිබඳ පවත්නා නීති සම්පාදනය පිළිබඳ ජාතික පාර්ශවකරුවන්ගේ උපදේශන සැසියක් පවත්වන ලදී. මෙහි අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ මානව වෙළඳාම පිළිබඳ නීති එම විෂයයට අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන්නේදයන්න සමාලෝචනය කිරීමයි. මෙම සැසියට නීතිපති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, පොලීසිය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, විදේශ කටයුතු අමාත්‍යාංශය, කම්කරු, කාන්තා

කටයුතු හා ළමා සංවර්ධන අධිකාරිය සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් සහභාගී වූහ. මෙම උපදේශනයෙන් පසුව, ප්‍රතිපත්ති සඳහා පහසුකම් සැලසීම සහ පුද්ගලයන් වෙළඳාම පිළිබඳ ILO ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශයේ සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම සභාපතිත්වය යටතේ පුද්ගලයන් වෙළඳාම පිළිබඳ මෙහෙයුම් කමිටුවක් පිහිටුවන ලදී.

- සංක්‍රමණිකයින් ලෙස යෑමට අපේක්ෂිත අයට මෙන්ම නැවත පැමිණෙන අයටද උපදේශන ආධාර සැපයීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය දිවයින පුරා පිහිටි සම්පත් මධ්‍යස්ථාන විසිපහක ක්‍රියාත්මක වන විශේෂ පුහුණුව ලත් උපදේශන නිලධාරීන් සේවයේ යොදවා ඇත. සුමිත්‍රයෝ, සහනපියස, Women in Need සහ සහනය වැනි වෙනත් සංවිධාන විසින් සපයනු ලබන උපදේශන සේවා වෙත යොමු කිරීමෙන් අවශ්‍යතා ඇති අයට තවදුරටත් සහාය වීම සඳහා ඔවුන් ඒ වෙත යොමු කිරීමේ පද්ධතියක් ද පවත්වාගෙන යයි. එවැනි ආයතන පූර්ව, පශ්චාත් සහ නඩු විභාගය වන කාලය අතරතුරදී පහසුකම් ලබා දීම සිදු කරනු ලැබේ.
- 1978 අංක 27 දරණ නීතිය යටතේ ස්ථාපිත කරන ලද ස්වාධීන ව්‍යවස්ථාපිත සංවිධානයක් වන ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවෙන් ප්‍රජාවේ වරප්‍රසාද නොලත් කොටස්වලට නොමිලේ නෛතික ආධාර සහ උපදෙස් ලබා ගත හැකි ය. එහි පරමාර්ථය වනුයේ සුදුසුකම් ලත් පුද්ගලයින්ට නීති උපදෙස් ලබා දීමෙන්, ඔවුන් නියෝජනය කිරීම සඳහා නීතිඥයින්ගේ සේවය ඇතුළුව නඩු පැවරීමේ සහාය ලබා දීමෙන් හා එවැනි කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් ආධාරවලින් ද කාර්යක්ෂම නීති ආධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමයි. දිවයින පුරා පිහිටි සියලුම මහාධිකරණවල පාහේ මෙහි ශාඛා ක්‍රියාත්මක වේ. නීති ආධාර කොමිෂන් සභාවේ සේවය කරන පළපුරුදු නීතිඥයින්ගේ කමිටුවකට නීති ආධාර අවශ්‍ය අයට නොමිලේ ප්‍රවේශ විය හැකි ය.
- දිවයින පුරා පිහිටුවා ඇති සියලු ම රජයේ රෝහල්වල වෛද්‍ය පහසුකම් සහ උපදේශන සේවා නොමිලේ ලබා ගත හැකි ය.
- ඉහත සඳහන් කළ පරිදි, මානව වෙළඳාමේ ක්‍රියාවලියට එරෙහිව ක්‍රියා කරන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ගණනාවක් ඇත. වින්දිතයාගේ උපරිම යහපත සඳහා නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ට ආයතන අතර තොරතුරු බෙදා ගැනීමට සිදු වේ. කෙසේ වෙතත්, සෑම පාර්ශවයක් ම සෑම විටම වින්දිතයාගේ ගෞරවය ආරක්ෂා කළ යුතු ය.

ශ්‍රී ලංකාවේ දරුවන්ට උපකාර කරනු ලබන සක්‍රීය රාජ්‍ය නොවන සංවිධාන ලැයිස්තුව මෙසේ දැක්විය හැක.

- UNICEF
- Save the Children
- LEEDS
- CARE
- World Vision International

## 7.5 වගකිවයුතු වාර්තාකරණය සහ රහස්‍යභාවය පවත්වා ගැනීම සඳහා මාධ්‍යයේ කාර්යභාරය

ජනමාධ්‍යවේදීන් සඳහා වන ආචාර ධර්ම පද්ධතියට අනුව ලිංගික අපරාධවලට ගොදුරු වූවන්ගේ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම තහනම් කරයි. නමුත් ළමා වින්දිතයා සම්බන්ධ නිශ්චිත විධිවිධාන නොමැත.

**රජයේ දැනුම් දීම්. ශ්‍රී ලංකා පුවත්පත් කවුන්සිලය විසින් 1973 අංක 5 දරණ ශ්‍රී ලංකා පුවත්පත් කවුන්සිල නීතියේ 30(i) (අ) වගන්තිය යටතේ ජනමාධ්‍යවේදීන් සඳහා ආචාර ධර්ම සංග්‍රහය සකස් කර ඇති අතර එම නීතියේ 30 (3) වගන්තිය යටතේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.**

**6 (1) අපරාධ හෝ අපරාධ නඩු වාර්තා කිරීම හෝ මුද්‍රණය කිරීම හෝ ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් මාධ්‍යවේදියෙකු ලිංගික අපරාධවලට ගොදුරු වූවන් නම් කිරීම නොකළ යුතුය**

ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 286 වන වගන්තිය යටතේ ළමයින් සම්බන්ධ ප්‍රකාශනය සම්බන්ධයෙන් කටයුතු කරන නමුත් මෙම විධිවිධානය තුළ රහස්‍යභාවය පිළිබඳ ප්‍රතිපාදන ප්‍රමාණවත් නැත.



*තොරතුරු වාර්තා කිරීම සහ බෙදා හැරීම සඳහා මෙවලම්*

**අ. තොරතුරු වලංගු කිරීම, වාර්තා කිරීම සහ බෙදා හැරීම**

- තොරතුරු වලංගු කිරීම සඳහා නිලධාරීන් විසින් දැනට ක්‍රමවේදයක් සකස් කර නොමැත. එබැවින් තොරතුරු වලංගු කිරීමේ වැදගත්කම සාකච්ඡා කළ යුතු අතර සාකච්ඡාව තුළ සහභාගිවන්නන්ගේ පවත්නා දැනුම භාවිතා කළ යුතු ය. (මිනිත්තු 15)

ප්‍රක්ෂේපන තිරය 14

උදාහරණය: අපරාධ පරීක්ෂණයක දී සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ පටිගත කිරීමේ දැනුම පොලිස් නිලධාරීන්ට ඇත. නමුත් ඒවා පටිගත කිරීම අවශ්‍ය නිසා පමණක් ම ප්‍රකාශය පටිගත කිරීම කිසිදු තොරතුරක් වලංගු කිරීමට උපකාරී නොවේ. වින්දිතයාගේ ප්‍රධාන ප්‍රකාශය හැරුණු විට අනෙක් සාක්ෂිකරුවන්ගේ අනෙකුත් ප්‍රකාශයන් වින්දිතයාගේ ප්‍රකාශය තහවුරු කිරීමේ වටිනාකමකින් යුක්ත විය යුතු ය.

මොඩියුලයේ දක්වා ඇති රජයේ සහ රාජ්‍ය නොවන සංවිධාන ලැයිස්තුව මගින් ඔවුන්ගේ කාර්යය සහ මැදිහත්වීම් පිළිබඳව කෙටියෙන් හඳුන්වා දෙන්න. (මිනිත්තු 15)

(මිනිත්තු 30)

**ආ. සාමාන්‍ය ජනතාවට අදාළ බලධාරීන් වෙත තොරතුරු සැපයිය හැකි ආකාරය**

- සහභාගී වන්නන් සමග විවෘත සාකච්ඡාවක් හරහා එකතු කරනු ලබන අදහස්, ප්‍රක්ෂේපන ඉදිරිපත් කිරීමක් මගින් තහවුරු කරන්න. (මිනිත්තු 20)

ප්‍රක්ෂේපන තිරය 15

**ඇ. රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය නොවන සංවිධාන, මාධ්‍ය සඳහා තොරතුරු මුදා හැරීම පිළිබඳව සලකා බැලීම සහ මහජනතාවගේ පෞද්ගලිකත්වය සහ ආරක්ෂණ ගැටළු සඳහා තොරතුරු මුදා හැරීම** (මිනිත්තු 15)

**ඈ. වගකිවයුතු වාර්තාකරණය සහ රහස්‍යභාවය පවත්වා ගැනීම සඳහා මාධ්‍යයේ කාර්යභාරය.** (මිනිත්තු 15)

- වීඩියෝ පටය වාදනය කරන්න (මිනිත්තු 4) - 25 Painfully Disturbing Facts About Human Trafficking - https://www.youtube.com/watch?v=dqCSgCDGNT8
- සිද්ධි අධ්‍යයනය (මිනිත්තු 15)
- පුද්ගලිකත්වය සහ ආරක්ෂණ ගැටළු පිළිබඳ තනි පුද්ගලයන් සතු දැනුම පරීක්ෂා කිරීම (මිනිත්තු 10)
- කුඩා කණ්ඩායම් සාකච්ඡා (විනාඩි 15)
- ප්‍රතිපෝෂණ සැසිය (මිනිත්තු 15)

(මිනිත්තු 45)